කොවිඩ්-19 වසංගතය මර්දනය කිරීම සඳහා කටයුතු කරමින් සිටිනා අවස්ථාවකදී, මාධ්‍ය අතද ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබේ. උදාහරණයක් ලෙසින් ගත් විට, කොවිඩ්-19 ආසාදිතයන් සහ ආසාදිත බවට සැක කොට නිරෝධායනය කර සිටින්නන් සමාජයේ කොන් කිරීමට හෝ සමාජ ගර්හාවට ලක් වන ආකාරයෙන් පුවත් වාර්තා නොකිරීම යහපත් හා ආචාර ධාර්මික මාධ්‍ය හැසිරීම ලෙසින් වටහා ගත හැක. කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හිද සඳහන් වන්නේ, 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසයි.

කෙසේ නමුත් කණගාටුවට කාරණය වන්නේ, මාධ්‍ය මගින් දිගින් දිගටම කොවිඩ්-19 ආසාදිතයන් සහ නිරෝධායනය කර සිටින්නන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී සමාජයේ කොන් කිරීමකට හෝ ගර්හාවට ලක් වන ආකාරයේ යෙදුම් භාවිතා කිරීමයි. ලංකාදීප පුවත්පතේ සඳහන් වන 'කොරෝනා ගැබිනි මව' යන්න සහ අරුණ පුවත්පතේ සඳහන් වන 'නැගණියගේ නිවසට මිනුවන්ගොඩ කතක් කොරෝනා රැගෙන ගිහින්' යන උප සිරස්තලය ඊට උදාහරණ ලෙසින් දැක්විය හැක.

මේ මොහොතේ අතිශයින්ම ආචාර ධාර්මික ලෙසින් මාධ්‍යකරණයෙහි යෙදීම, කොවිඩ්-19 මර්දනය කිරීමේ වෑයමටද සහායක් සපයනු ඇති බවද අවසන් වශයෙන් අපි සටහන් කරමු.

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Coronavirus #Lankadeepa #Arun**